[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

පම්පෝරි ගැහුවේ. ඇයි, ඒ? ඒ ජනතාව පාඩු කරලා නොවෙයි. මෙන්න මේ පගාව ගත්ත කට්ටිය තමයි ඒ පාඩුව කරලා තිබෙන්නේ. දැන් ආරංචි වෙනවා නේ, ඒ ගිණුමෙන් අර ගිණුමට ගියා, ඕස්ට්‍රේලියාවට ගියාම නෝනා, "දන්නේ නැහැ, මතක නැහැ, අපේ ගිණුමට සල්ලි ආව හැටි අපි දන්නේ නැහැ" කියනවා. අද කියනවා, "ඔන්න සිංගප්පූරු ගිණුමට සල්ලි ගිහිල්ලා තිබෙනවා, නිමල් පෙරේරාගේ ගිණුමට ගිහිල්ලා තිබෙනවා" කියලා. ඉතින්, මේ සියල්ලෝම එක වළල්ලක් නේ. මේ නිමල් පෙරේරා කියන නම පැන් ඒෂියා බැංකුවයි, අර්ථ සාධක අරමුදලයි ගැන කථා කරනකොට නැවත එනවා. පර්පර්වුවෙල් ට්‍රෙෂරීස් සමාගම පැන් ඒෂියා එකෙන් බැඳුම්කර අරගෙන තිබෙනවා. ඒ ගනුදෙනුවේ මැද ඉන්නේත් නිමල් පෙරේරා. දැන් බලාගෙන යනකොට, පගාව ගන්නකොට, පගාවෙන් කොටසක් යනවා, නිමල් පෙරේරාට. මොකක්ද මේ සෙල්ලම? මහ ජනතාවගේ ඡන්දයක් ගත්ත මිනිස්සු නොවෙයි මේ කවුරුවත්. ජන වරමක් තිබෙන මිනිස්සු නොවෙයි මේ කවුරුවත්. මේ, මේ රටේ ජනතාවගේ සල්ලි කොල්ලකන සුදු කරපටි අපරාධකාරයෝ ටිකක්. මේ අපරාධ වළල්ල පිළිබඳව හෙළිදරව් කරලා විතරක් මදි. මේ අය නීතිය ඉදිරියට ගෙනෙන්න ඕනෑ; නීතියේ සාධාරණත්වයට ගෙනෙන්න ඕනෑ. ඒකට ජනතාව මැදිහත් වෙන්න ඕනෑ. මම කියන්නේ ඒකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් නියමිත කාලය අවසානයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම අවසන් වශයෙන් මේ කාරණය කියනවා. විශේෂයෙන්ම අද මේ පාර්ලිමේන්තු සැසිවාරයේ අවසාන දවස වෙන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. එහෙම වෙනවා නම්, මම එක දෙයක් විශේෂයෙන්ම අපේ ගරු කථානායකතුමාට කියනවා. මේ කාරණා හෙළිදරව් කරන්න විගණකාධිපතිතුමාගේ නිලධාරින්ටත්, පෞද්ගලිකව මටත්, COPE එකටත් එතුමා අගනා සහයෝගයක් දීලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේ තත්ත්වය රටට හෙළිදරව් කරන්න, මාධ්‍යවලින් ප්‍රචාරය කරන්න ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පළමු වතාවට මාධ්‍ය ඒකකයක් ආරම්භ කරලා තිබෙනවා; මාධ්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, COPE එක සජීවීව සමාජගත කරන්න අවස්ථාව මේ පාර්ලිමේන්තුවට ලබා දෙන්න පෞද්ගලිකව දැඩි මහන්සියක් දරපු කෙනෙක් තමයි, ගරු කථානායකතුමා. ඒ නිසා මම පෞද්ගලිකව ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සඳහන් කළා, නිමල් පෙරේරා කියලා පුද්ගලයෙක් ගැන. ඔහු මේ රටේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්. එතුමාගේ නම සඳහන් කළ නිසාත්, එතුමා මේ සභාවේ නැති නිසාත් මම කියන්න කැමැතියි, අද රටේ ප්‍රධාන පුවත් පත්වල විශේෂයෙන් සඳහන් වෙලා තිබෙනවා ශ්‍රීලන්කන් ගුවන් සේවාවට යානා මිලදී ගැනීම පිළිබඳව කපිල චන්ද්‍රසේනගේ බිරිඳගේ ගිණුමේ සිට ඩොලර් ලක්ෂ අටක මුදලක්,

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට මම කියන මේ කාරණයේ වැදගත්කම තේරෙයි. ඩොලර් ලක්ෂ අටක මුදල් ප්‍රමාණයක් අත්සන් කරලා එවලා තිබෙනවා නිමල් පෙරේරාට. මේ තමයි ක්‍රිෂ් ගනුදෙනුවේ කළු සල්ලි සුදු කරපු නිමල් පෙරේරා. මේ තමයි airbus ගනුදෙනුවේ කළු සල්ලි සුදු කරපු නිමල් පෙරේරා. ඔහු මේ රටේ බැංකුවක සභාපතිවරයකු නිසා, මේ රටේ මූල්‍ය වෙළෙඳ පොළ කටයුතු කරපු නිසා මේ රටේ සිදු වූ දූෂණවල,- [බාධා කිරීමක්] ඒ විදේශ මුදල් සුදු කරලා දුන්නේ කාටද කියලා අද සඳහන් වෙලා තිබෙනවා. ඒ තැනැත්තාගේ නම සඳහන් වන්නේ නාමල්- [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මීට වඩා කාලය ලබා දෙන්න බැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ද කියන ප්‍රශ්නය තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ, පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ- [බාධා කිරීමක්] බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අද වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එහෙම නම්, එතුමා උත්තර දෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරුන්දික ප්‍රනාන්දු රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා (සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து - சுற்றுலா மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Arundika Fernando - State Minister of Tourism Promotion Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ විපක්ෂය විසින් ශ්‍රීලන්කන් ගුවන් සේවයට අදාළව ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් කරුණු කීපයක් කියන්න ඕනෑ. ශ්‍රීලන්කන් ගුවන් සේවය, මගේ ව්‍යක්තිමය ජීවිතය පටන් ගත්ත ආයතනය. මම, එම ගුවන් සේවයේ අවුරුදු 20